# පරිසර දූෂණය හා නීතිය


## ප්‍රියාණි විජේසේකර
නීතිඥ, ලේකම් - නීති කොමිෂන් සභාව


ශ්‍රී ලංකාවේ පරිසරය දූෂණය කිරීම පිළිබඳ දඬුවම් දණ්ඩ නීති සංග්‍රහයේ සිට පළාත් පාලන ආයතන සම්බන්ධ අණ පනත්වල දක්වා පැතිරී පවත්නා ප්‍රඥප්ති විශාල සංඛ්‍යාවක නියම කර ඇති අතර, අදාළ වැරදි, නිශ්චිත පරිසර දූෂණයේ සිට හුදෙක් ම, හානියක් සිදු කිරීමේ හැකියාවක් ඇති යම් කටයුත්තක් කිරීම හෝ අවශ්‍ය බලපත්‍රය නැතිව යම් කටයුත්තක් කිරීම දක්වා පැතිරී ඇත්තේ ය. නිශ්චිත පරිසර දූෂණයක් සිදුවන විට එහි ප්‍රතිඵලය සුළු අපහසුතාවයක සිට ප්‍රතිකර්ම යෙදිය නොහැකි තත්ත්වයක් දක්වා වෙනස් විය හැකි අතර එමගින් ශාක සහ සත්ව ජීවිත වඳ වී යාම මනුෂ්‍යයන්ගේ මරණය ද සිදු විය හැකි ය. වරදකාරී කටයුතු අප්‍රවේශම්කාරීව, නොසැළකිලිමත් හෝ හිතාමතාම කරන ලද ඒවාවිය හැකි අතර, වරද සම්පූර්ණ වගකීම හා බැඳුණු එකක් නම් එය සුළු මට්ටමේ වැරදි නිගමනයක් ද විය හැකි ය.

ආරක්ෂා සහිත පරිසරයක වැදගත්කම විද්‍යාත්මක සහ සාමාජික වැඩ සටහන් බොහෝ ගණනක ක්ෂේත්‍රය වී ඇති අතර එවැන්නක් නොකඩවා ම තිබීම ජීවිතයේ පැවැත්මට ඉතා වැදගත් වන හෙයින් ඒ ගැන අනවශ්‍ය තරම් අවධාරණය කළ යුතු නැත. හානිය ජීවිතයට බලපෑම ආරම්භ වූ අවස්ථාවේ දීම දියුණු වූ රටවල් පරිසරයේ පවිත්‍රතාවය ගැන සැළකිලිමත් වූ අතර, අද රටවල් රාශියකම ආණ්ඩු, පරිසරය ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා වූ වැඩ සටහන් විද්‍යාඥයන්, අධ්‍යාපනඥයන් සහ සමාජ සේවකයන් සඳහා පමණක් නොව, ව්‍යවස්ථා සම්පාදකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා ද අතිශය වැදගත්කමින් යුත් විෂයයක් හැටියට සළකනු ලැබේ.

පරිසරය, බරපතල දූෂණයෙන් සාර්ථක ලෙස ආරක්ෂා කිරීම සඳහා දැනට පවත්නා නීතිය ප්‍රමාණවත් නොවන බව, ශ්‍රී ලංකාවේ දැනට පවත්නා ව්‍යාවස්ථාපිත විධි විධාන පිළිබඳ සමීක්ෂණයක දී පෙනී ගොස් ඇත. මෙම ලිපියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවෙහි තිබෙන පරිසරය සම්බන්ධ අණ පනත් පිළිබඳව සමීක්ෂණයක් පැවැත්වීම නොවේ; ඇත්ත වශයෙන් ම එබඳු කාර්යයක් කළහොත් ලිපියේ කරුණු ඉතා දීර්ඝ වීමට ඉඩ ඇත. එසේ වුවද මෙම විෂයයට සම්බන්ධ විවිධ ප්‍රඥප්තිවලින් කිහිපයක් විශේෂයෙන් දැක්වීම ප්‍රයෝජන වත් විය හැකි ය.

(අ) 1947 රජයේ ඉඩම් ආඥා පනත මගින්, ජල මාර්ග හා වෙරළ ආරක්ෂා කිරීම සහ පස සෝදා යෑම වැළැක්වීම සඳහා විධි විධාන සැලැස්වෙයි.

(ආ) 1980 අංක 26 දරණ ආහාර පනත මගින්, මයිකොටොක්සීන්, බර ලෝහ වැනි අපවිත්‍ර කාරක සහ ජෛව අපවිත්‍ර කාරක පාලනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වෙයි.

(ඇ) 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පිළිබඳ පනත සහ ඒ සම්බන්ධ තදනන්තර සංශෝධන මගින්, පරිසරය පිළිබඳ සම්මතයන් වර්ධනය කිරීම, සහ පරිසරය වැඩි දියුණු කිරීම පිණිස යෝජනා ක්‍රම සකස් කිරීම සඳහා විධි විධාන සැලැස්වෙයි.

(ඈ) 1907 කැලෑ ආඥාපනත සහ ඊට සම්බන්ධ සංශෝධන මගින් වෙනත් ක්‍රියාවන් අතර, ගස් හෝ දැව කැපීම, ඉරීම, පෙරලීම හෝ ඉවත් කිරීම ද කැලෑ නිෂ්පාදන ඉවත් කිරීම ද වැළැක්වීම සඳහා උත්සාහ කෙරේ. කැලෑ වල හට ගන්නා ගිනි සම්බන්ධ කටයුතු පිළිබඳව ද එමගින් විධි විධාන සැලැස්වෙයි.

(ඉ) 1924 පැළෑටි ආරක්ෂා කිරීමේ ආඥාපනත පනවනු ලැබුවේ, පැළෑටිවලට හානිකර වූ වල් පැළෑටි, පළිබෝධ සහ රෝග ශ්‍රී ලංකාව තුළට ගෙනඒම සහ එහි තුළ පතුරුවාලීමට විරුද්ධව වඩා හොඳ විධි විධාන සැලැස්වීම සඳහා ය.

(ඊ) 1980 අංක 33 දරණ පළිබෝධ නාශක පාලනය කිරීමේ පනතින් වගාවන් සහ පරිසරයේ සිටින විනාශ කිරීමට ඉලක්ක නො වූ ජීවීන් කෙරෙහි හානිකර බලපෑම් ඇති කිරීමෙන් තොරව, අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම පිණිස පළිබෝධ නාශක වල ගුණය ආරක්ෂා කිරීම පිණිස විධිවිධාන සැලැස්වෙයි.

(උ) 1951 අංක 25 දරණ පස් සංරක්ෂණ පනත පස සෝදායෑම වැළැක්වීම සඳහා උත්සාහ කෙරෙන අතර පසට හානි සිදුවීම වැළැක්වීම සඳහා නැවත වන වගාව, වේලි සමෝච්ච වැටි ආදිය ඉදි කිරීම ආදී ක්‍රම නියම කෙරෙයි.

(ඌ) 1978 අංක 58 දරණ ගොවිජන සේවා පනත මගින්, වෙනත් කාරණා අතර, කෘෂි රසායනික ද්‍රව්‍ය යෙදීමේ දී

ආරක්ෂක උපකරණ පාවිච්චිය සහ කාර්මික අපද්‍රව්‍ය කුඹුරුවලට සහ සුළු වාරි මාර්ගවලට ගලා යෑම වැළැක්වීම පිළිබඳව නියෝග සෑදීම සඳහා විධි විධාන සැලැස්වෙයි.

(එ) පසුව සංශෝධනය කරන ලද 1964 අංක 44 දරණ වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනත මගින්, ජාතික වන සත්ව ආරක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම, ඇතැම් සත්වයන් ආරක්ෂා කිරීම, සතුන් හෝ ඔවුන්ගේ හම්, මස් ආදිය අපනයනය කිරීම තහනම් කිරීම පිණිස විධි විධාන සැලැස්වෙයි.

(ඒ) 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන ආයතන පනත මගින්, අභ්‍යන්තර ජාලශ වල, වෙරළබඩ වගුරුවල සහ අක් වෙරළ ප්‍රදේශවල ජලජ සම්පත් සංවර්ධනය කිරීම කළමනාකරණය සහ සංරක්ෂණය සඳහා විධි විධාන සැලැස්වෙයි.

(ඔ) 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ පනත මගින්, හිරිගල් කැඩීම තහනම් කිරීම ආදිය සඳහා විධි විධාන සැලැස් වෙයි.

(ඕ) 1981 අංක 59 දරණ මුහුදු පරිසර දූෂණය වැළැක්වීමේ පනත මගින්, තෙල් මුහුදට දැමීම මගින් පරිසර දූෂණය කිරීම වැළැක්වීම සඳහා වූ අන්තර් ජාතික සම්මුති ක්‍රියාත්මක කිරීම පිණිස උත්සාහ කෙරේ.

(ක) 1980 අංක 47 දරණ ජාතික පරිසර පනත මගින්, පරිසරය ආරක්ෂා කිරීම සහ පාලනය කිරීම සඳහා ද, මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීම සඳහා ද විධි විධාන සැලැස්වෙයි.

ඉහත සඳහන් ලේඛණයේ ඇතුළත් වන්නේ මෙම ක්ෂේත්‍රයට අදාළ ප්‍රඥප්ති විශාල සංඛ්‍යාවෙන් කීපයක් පමණකි. අණ පනත් සඳහන් වන සම්පූර්ණ ලැයිස්තුවක් මෙයට අමුණා ඇති උපලේඛණයේ දැක්වේ.

රජය මේ දක්වා මෙම විෂයය කෙරෙහි දක්වා ඇති සැළකිල්ලේ හා උනන්දුවේ ප්‍රමාණය මේ අණ පනත් වලින් පැහැදිළි වේ. රෝම නීතියේ පැරණි පාඨ ග්‍රන්ථවල (ජස්ටීනියන්ගේ ඉන්ස්ටිටියුම් ලීස් ගේ රෝම නීතිය නම් ග්‍රන්ථය බලන්න.) පිළිගෙන ඇති ආකාරයට වාතය, ගලායන ජලය සහ මුහුදු වෙරළ සියලු දෙනාට ම අයත් විය. පරිසරයේ වැදගත්කම ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් ද පිළිගෙන ඇති අතර එහි 27 (14) වන ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙයි.

"ජනතාවගේ යහපත තකා රජය විසින් පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කොට වැඩි දියුණු කළ යුත්තේ ය."

පරිසර දූෂණය බොහෝවිට ම, ජනතාවට ප්‍රතිලාභ ලැබෙන නීත්‍යනුකූල කටයුතුවල අතුරු ඵලයක් වන්නේ ය. මෙම කටයුතු නිසා පරිසර දූෂණය ඇති වන්නේ එමගින් හටගන්නා අපද්‍රව්‍ය අඩු කිරීම, නැවත ප්‍රයෝජනයට ගැනීම සඳහා සකස් කිරීම, ගබඩා කර තැබීම හෝ අපහරණය කිරීම සඳහා අඩු ලුහුඬු කමින් තොර සහ නොවරදින සුළු විධි ක්‍රමයක් තවමත් නොමැති නිසා ය. මේ මගින් සිදුවන හානිය නම්‍ය වන අතර බොහෝ විටම වක්‍රව ද, සමුච්චිතව ද, ටිකින් ටිකව ද සිදු වේ. එහි දීර්ඝ කාලීන බලපෑම් වළක්වා ගත හැකි වන්නේ ඒ තත්ත්වය ඇති කරන ඒ ඒ සිද්ධීන් නතර කිරීම මගින් පමණකි. එම නිසා දිගු කාලීනව ඇති විය හැකි මෙම තර්ජනය, තාක්ෂණික අවශ්‍යතාවන් සහ ආර්ථික යථාර්ථයන් සමග තුලනය කර බැලිය යුතුව ඇත.

අද බොහෝ රටවල පරිසර දූෂණය යන කාරණය පිළිබඳව නීති, පනත්, රෙගුලාසි හෝ ප්‍රතිපත්ති නියමයන් ගණනාවක් ම තිබේ. ශ්‍රී ලංකාවේ, පරිසරය සම්බන්ධ නීති විධි අණ පනත් වල විසිරී අහම්බෙන් දක්නට ලැබෙන අතර පරිසරය පිළිබඳ මූලික නීතියක් තවමත් ගොඩනැගෙමින් පවතී.

දැනට පවත්නා අණ පනත්වල අඩුලුහුඬුකම් සහ ඌනතාවන් ගැන මේ අවස්ථාවේ දී සළකා බැලීම යෝග්‍ය වන්නේ ය. දැනට පවත්නා නීති බොහොමයක් ම යටත් විජිතවාදී සහ යල්පැන ගිය ඒවා වන අතර, ඒවායේ විෂය ක්ෂේත්‍රය ද සීමා වී ඇත. එම නිසා වර්තමාන අවස්ථාගත කරුණු අනුව සළකමින් අලුත් සොයා බැලීමක් කළ යුතු අතර, ආර්ථික සංවර්ධනය මත පදනම් වූ හා පරිසරය හා සම්බන්ධතාවක් ඇති, පස සංරක්ෂණය, වනාන්තර හා සත්ව ජීවිත ආරක්ෂා කිරීම, කාර්මික පරිසර දූෂණය, සාගර පරිසර දූෂණය, මුහුදු වෙරළ ආරක්ෂා කිරීම සහ න්‍යෂ්ටික පරිසර දූෂණය වැනි සියළු ම අංශ ආවරණය කෙරෙන මුළුමනින් ම අලුත් නීති ප්‍රතිසංස්කරණ සමූහයක් ඇති කිරීම ඉතා යෝග්‍ය වන්නේ ය. එපමණක් ද නොව (1920) මුතු බෙලි ආඥාපනත වැනි යල්පැනගිය සහ අසාර්ථක ඇතැම් නීති අවලංගු කළ යුතු ය. නැතහොත් ප්‍රතිශෝධනය කළ යුතු ය.

මෙම විවිධ නීතිවලින් නියමිත දඬුවම් බොහෝවිටම අසතුටුදායක තරමට අප්‍රමාණ වත් වන අතර, නිවර්තක ලෙස ක්‍රියාත්මක වන්නේ ම නැත. ඒ නිසා වැදරකරුවෝ වනාන්තර සහ හිරිගල් සම්පත් විනාශ කිරීමේ දී සාමාන්‍යයෙන් ම අනුන් ගැන නොසළකා ම හා බාධාවකින් තොරව ම ක්‍රියා කරති. ඇතැම් දඩ වනුයේ රු. 25 ක් පමණ අඩු මුදලකි. පරිසරය විනාශ කිරීම අපරාධයක් වශයෙන් සැළකිය යුතු යැයි බටහිර ලෝකයේ රටවල් බොහොමයක් යෝජනා කර ඇති අතර, හිතමතාම සිදු කරන හානිය සඳහා දඬුවම ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීම ද විය යුතු යයි යෝජනා කර ඇත. ශ්‍රී ලංකාවෙහි ද, පරිසරයට හානි කිරීම බරපතළ අපරාධයක් වශයෙන් සැළකිය යුතු යැයි ද ඒ සඳහා දැඩි දඬුවම් පැමිණ විය යුතු. යැයි ද යෝජනා කරනු ලැබේ මෙය හැරුණු විට ශ්‍රී ලංකාවේ පවත්නා තවත් දුර්වලතාවයක් වනුයේ නීති ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති වීමයි. මෙම තත්ත්වයට හේතු ප්‍රමාණවත් තරම් අරමුදල් නොමැති වීම සහ පරිපාලන පහසුකම් හිඟය ආදිය විය හැකිය. පරිසරයේ ගුණය වූ කලී කෙතරම් මූලිකවූත් අසාමාන්‍යවූත් සහ තර්ජනයට පාත්‍ර වී ඇත්තාවූත් වටිනාකමින් යුක්ත වන්නේ ද කියතොත් එයට බරපතළ ලෙස හානි සිදු කිරීම හෝ එය අනතුරට පත් කිරීම අලුත් අණ පනත් වලදී අපරාධ වශයෙන් සැළකිය යුතු තරම් වන්නේ ය.

## උපලේඛණය

1990 වාරි මාර්ග ආඥා පනත
1935 ඉඩම් සංවර්ධන ආඥා පනත
1947 රජයේ ඉඩම් ආඥා පනත
1973 අංක 4 දරන පතල් සහ ඛනිජ පනත
1980 අංක 27 දරන විලවුන් සහ ඖෂධ පනත
1980 අංක 26 දරන ආහාර පනත
1946 නගර සහ ග්‍රාම නිර්මාණ පනත
1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත
1907 කැලෑ ආඥා පනත
1974 අංක 2 දරන ජලසම්පාදන සහ ජලාවහන පනත
1924 පැළෑටි ආරක්ෂා කිරීමේ ආඥා පනත
1980 අංක 33 දරන කෘමි නාශක පනත
1951 අංක 25 දරන පස් සංරක්ෂණ පනත
1978 අංක 58 දරන ගොවි ජන සේවා පනත
1964 අංක 29 දරන ජලසම්පත් මණ්ඩල පනත
1964 අංක 17 දරන සංචාරක කර්මාන්ත සංවර්ධන පනත
1937 වෘක්ෂලතා සහ වන සත්ව ආරක්ෂක ආඥා පනත
1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත
1940 ධීවර ආඥා පනත
1956 හක්බෙලි ආඥා පනත
1956 මුතුබෙලි ආඥා පනත
1981 අංක 59 දරන සාගර පරිසර දූෂණ පනත
1942 අංක 45 දරන කර්මාන්ත ශාලා ආඥා පනත
1864 ගැස් ආඥාපනත
1887 ඛනිජ තෙල් ආඥා පනත
1980 අංක 47 දරන ස්වාභාවික පරිසර පනත